# SKY LINE TRAVELS (PVT) LTD.

1st Floor, Jubilee Hall, St. Mary's Church, Grand Street, Negombo.
Contact: 031 2283555 / 077 370218 / 077 7797428
infor@skylinetravels.lk / www.skylinetravels.lk

IATA | Accredited Agent


## පළමු වන දිනය - *(රාත්‍රී)*

**කටුනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොලින් පිටත්ව, හුවමාරු ගුවන්තොටුපල වෙත පැමිණ, අම්මාන් ගුවන්තොටුපලට ළගාවීම. ඉන්පසු අප නවාතැන් ගන්නා හෝටලයට පැමිණ විවේක ගෙන එදින රාත්‍රී ආහාරය ගෙන හෝටලයේ නවාතැන් ගැනීම.**

## දෙවන දිනය - *(උදේ / දිවා / රාත්‍රී)*

**හෝටලයේදී උදැසන ආහාරය ගැනීම. නිබෝ කන්ද දැක බලා ගැනීම සඳහා පිටත්වීම. ඊශ්‍රායලය බලා සීමා මායිම් තරණය කිරීම. ඉන් පසු බෙතානියට ගමන් කර ලාසරස් හා ඔහුගේ සහෝදරියන් දෙදෙනෙකු වන මාර්තා හා මරියා වාසය කළ නිවස බැහැදැකීම. ඉන් අනතුරුව ලාසරස්ගේ සොහොන නැරඹීම. (ජුවාම 11 : 1-45). ඉන්පසු ජෝර්දාන් නදිය වෙත ගමන් කිරීම.**

**මෙම ස්ථානය ජේසුස් වහන්සේ ස්නාවක ජොහාන් තුමා අතින් බෞතිස්ම වූ ස්ථානයයි. මෙහිදී ඔබගේ ප්‍රසාද ස්නාපන පොරොන්දුව අලුත් කිරීමද සිදු කරයි. ඉන් අනතුරුව ජෙරිකෝව බලා පිටත්ව ජේසුස් වහන්සේව දැකබලා ගැනීම පිණිස සකෙවුස් නැග සිටි අත්තික්කා ගස දැක ගැනීම. (ලූක් 19 : 1-10). ජෙරිකෝව අත්පත් කරගැනීම පිළිබඳ ශු. බයිබලයේ සඳහන් වෙයි. (ජෝෂුවා 6 : 1 - 27). ලෝකයේ පැරණිතම ජනාවාස ලෙස සැලකෙන වසර 10,000 කට වඩා පැරණි ජෙරිකෝ මුල් නගරයේ නටඹුන් දැකබලා ගැනීමට ඔබට අවස්ථාව ලැබෙනු ඇත. ඉන් අනතුරුව ජෙරිකෝවේ සිට දූර්පරීක්ෂාවේ කන්ද දක්වා කේබල් කාර් මගින් ගමන් කිරීම. එහිදී ඔබට එම අත්දැකීම ද ලබාගත හැක. ජේසුස් වහන්සේ ප්‍රසාද ස්නාපනය ලැබීමෙන් අනතුරුව ශුද්ධාත්මානු භාවයෙන් පාලුකරයට යන ලද මෙම කඳු මුදුනට ගමන් කර ඒ ස්ථානයද ඔබට වන්දනා මාන කිරීමට අවස්ථාව උදාවනු ඇත. මෙම ස්ථානය ජේසුස් වහන්සේ දින 40 ක් සහ රාත්‍රී 40 ක් නිරාහාරව භාවනාවේ යෙදී සිටි ස්ථානයයි. (ලූක් 4: 1-9). මෙම ස්ථානය මුහුදු මට්ටමේ සිට මීටර් 430 ක් උසින් පිහිටා ඇති අතර එහි සිට ජෝර්දාන් මිටියාවත හාත්පස පෙනෙන දර්ශනයක් දැකබලා ගැනීමට ඔබට අවස්ථාව හිමිවනු ඇත. මෙහිදී සිංහල බසින් සංවිධානය කරනු ලබන දිව්‍ය පූජා යාගයට සහභාගී වීම, ඉන් පසු දිවා ආහාරය, දිවා ආහාරයෙන් පසුව ලෝකයේ පහළම ස්ථානය වන මල මුහුද වෙත ගමන් කිරීම. මෙහි ලවනත්වය වැඩි හෙයින් ඔබ එහි නොගිලී පාවෙනු ඇත. එම අත්දැකීමට ඇතුළු වීමට ඔබට අවස්ථාව ලැබෙනු ඇත. ඉන් පසු රාත්‍රී ආහාරය ගෙන හෝටලයේ නවාතැන් ගැනීම**

## තුන්වන දිනය - *(උදේ / දිවා / රාත්‍රී)*

**උදැසන ආහාරය හෝටලයේදී ගෙන ඉන්පසු ගාබ්‍රියෙල් දේවදූතයා මරිය තුමියට මංගලම් කියූ ස්ථානය හා මරි මව්න්ගේ නිවස පිහිටි ස්ථානය නැරඹීම. (ලූක් 1 : 26-38)**

**මෙහිදී සිංහල බසින් සංවිධානය කරන ලද දිව්‍ය පූජා යාගයට සහභාගී වීම. ඉන්පසු ශාන්ත ජුසේ තුමන්ගේ දේවස්ථානය වෙත ගමන් කිරීම හා ජුසේ තුමන්ගේ වඩු මඩුව තිබු ස්ථානය ද ඔබට දැක ගැනීමේ අවස්ථාව ලැබෙනු ඇත. ඉන් අනතුරුව මරිය තුමිය ජලය ලබාගත් ස්ථානය හා නාසරෙත්හි සිනගෝගය වෙත ගමන් කිරීම. (ලූක් 4 : 16-27) ඉන් අනතුරුව ජේසුස් වහන්සේව ප්‍රතික්ෂේප කර කන්ද මුදුනින් පහලට තල්ලු කිරීමට උත්සහ කල කඳු මුදුනට යාම. (ලූක් 4 : 28-30)**

SKY LINE TRAVELS (PVT) LTD

ඉන් අනතුරුව ගලීල මුහුද ආසන්නයේ පිහිටා තිබෙන උස් කඳු මුදුනට ගමන් කිරීම. ජේසුස් වහන්සේ මෙම ස්ථානයේ සිට භාග්‍ය අට දේශනා කළේය. ශු.මතෙව් තුමාගේ සුවිශේෂයේ මේ පිළිබඳව සඳහන් වේ. (මතෙව් 5:112) ජේසුස් වහන්සේ පූප වැඩි කිරීමේ ප්‍රාතිහාර්ය සිදු කළ ස්ථානය වෙත ගමන් කිරීම. ශු. මතෙව් තුමාගේ සුවිශේෂයේ සඳහන් වන පරිදි උන්වහන්සේගේ දේශනා ඇසීම පිණිස පැමිණි පන්දහසකට වඩා අධික පිරිසකට කෑම පිණිස මසුන් දෙදෙනෙකු සහ රොටී පහක් ගෙන ආහාර පිණිස ලබාදුන් ස්ථානයයි. මෙම ස්ථානය “තගා” නමින්ද හඳුන්වයි. ශු. බයිබලයේ මෙම ස්ථානය පිළිබඳ මෙසේ සඳහන් වෙයි. (මතෙව් **14 : 13-21)**. ඉන්පසු ජේසුස් වහන්සේ උත්ථානයෙන් පසු පේදුරු තුමා ඇතුළු ගෝලයින්ට ගලීල මුහුද ආසන්නයේ දී දර්ශනය වී පේදුරු තුමාව ශුද්ධවූ සභාවේ නායකත්වයට පත්කිරීම හා එහිදී ඔවුන් විසින් අල්ලන ලද මසුන් අඟුරු මත පුළුස්සා උන්වහන්සේ තම ගෝලයින් සමග අනුභව කළ ස්ථානය දැකබලා ගැනීම. (ජොහාන් **21 : 6-18)**

ඉන්පසු දිවා ආහාරය ගෙන කපර්ණාවුමට පැමිණ සිනගෝගය (ධර්ම ශාලාව) (ලූක් **4 : 31-37)** නැරඹීම හා පේදුරු තුමාගේ නැන්දනියගේ නිවස පිහිටා තිබූ ස්ථානය බැහැදැකීම. (ලූක් **4 : 38-41)** වර්තමානයේ විශාල දෙව්මැදුරක් එහි ඉදිකර ඇත. ඉන් අනතුරුව ජේසුස් වහන්සේ ප්‍රාතිහාර්ය කළ ගලීල මුහුද වෙත ගොස් එහි බෝට්ටු චාරිකාවක යෙදීමට ඔබට අවස්ථාව ලැබෙනු ඇත. මෙම ස්ථානය පිළිබඳවද ශු.බයිබලයේ සටහන් වී ඇත. (ජොහාන් **6 : 16-21)** හා (මාක් **4 : 35-41)** ඉන්පසු රාත්‍රී ආහාරය ගෙන හෝටලයේ නවාතැන් ගැනීම.

## හතරවන දිනය - *(උදේ / දිවා / රාත්‍රී)*

හෝටලයේදී උදෑසන ආහාරය ගෙන ඉන්පසු ගලීලයේ කානා නුවර ජේසුස් වහන්සේ විසින් සිදු කරන ලද ප්‍රථම ප්‍රාතිහාර්ය නැතහොත් ප්‍රථම දේව බල ප්‍රකාශනය කරන ලද ස්ථානයට ගමන් කිරීම. එහිදී සංවිධානය කරනු ලබන සිංහල දිව්‍ය පූජා යාගයට සහභාගී වීමට ඔබට අවස්ථාව හිමිවන අතර චාරිකාව සඳහා සහභාගී වන විවාහක යුවල් සඳහා විවාහ පොරොන්දු අලුත් කිරීමද සිදු වේ. (ජොහාන් **2 : 1-12)**

ඉන්පසු තාබෝර් කඳු මුදුන වෙත ගමන් කිරීම. ජේසුස් වහන්සේ අන්‍ය රූප විලාස වූ ස්ථානය තාබෝර් කන්ද වේ. මේ අවස්ථාවේ දී ජේසුස් වහන්සේ සමග තම ශ්‍රාවකයින් තිදෙනෙකු වන පේදුරු තුමා, ජුවාම් තුමා හා ජාකොබ් තුමා සහභාගී විය. (මාක් **9 : 2-8)** අනතුරුව දිවා ආහාරය ගෙන, හයිෆා සිට කාර්මෙල් කන්ද වෙත පිටත්වීම. මෙය එලියා දිවැසිවරයා ජීවත්වූ ස්ථානයයි. ඉන් අනතුරුව “ජැෆා” හී ශා. පීතර දේවස්ථානය නැරඹීම සඳහා පිටත්වන අතර අප, පසුව රාත්‍රී නවාතැන් ගන්නා හෝටලය වෙත පැමිණ රාත්‍රී ආහාරය ගෙන නවාතැන් ගැනීම.

## පස්වන දිනය - *(උදේ / දිවා / රාත්‍රී)*

උදෑසන ආහාරය හෝටලයේදී ගෙන එදින චාරිකාව ආරම්භ කිරීම. මෙදින අප මරිය තුමියට ගාබ්‍රියල් දේවදූතයා දර්ශනය වී මංගලම් කීමෙන් අනතුරුව මරිය තුමිය තම ඥාති සහෝදරිය වන එලිසබෙත් තුමියව බැහැදැකීමට විශාල දුරක් ගෙවා එනම් නාසරතයේ සිට ජෙරුසලම ආසන්නයේ පිහිටි “එයින් කරීම්” යන ග්‍රාමය වෙත පැමිණියාය. වර්තමානයේ මෙම ස්ථානයේ විශාල අලංකාර දෙව්මැදුරක් ඉදිකර ඇති අතර එය සියැසින් දැක ගැනීමට ඔබට අවස්ථාව ලැබෙනු ඇත. (ලූක් **1 : 39-56)** ඉන් අනතුරුව ස්නාවක ජොහාන් තුමා උපත ලැබූ ස්ථානය නැරඹීම. (ලූක් **1 : 57-66)** ඉන් පසු දිවා ආහාරය ගෙන බෙත්ලෙහෙම බලා පිටත් වීම.

බෙත්ලෙහෙමේ සංසනනයකට සහභාගී වීම සඳහා ජුසේ තුමන් හා ගැබ්ගෙන සිටි මරිය තුමිය පැමිණෙන විට මරිය තුමියගේ ප්‍රසව කාලය සම්පූර්ණ වීම නිසා එතුමියට තම කුලුදුල් පුත්‍රයා බිහිකිරීමට සිදුවන්නේ ගව මඩුවකය. ජේසු බිළිඳුන් උපන් මෙම ස්ථානයේ වර්තමානයේ විශාල දේවස්ථානයක් ඉදිකර ඇත. උන්වහන්සේ උපන් ස්ථානයේ රිදී තාරකාවක් සවිකර ඇත. ඒ වගේම උන්වහන්සේව රෙදි වලින් ඔතා බහලූ ගව ඔරුව තිබූ ස්ථානය උන්වහන්සේ ඉපදුන තැනට දකුණු පැත්තෙන් ඇත. **(මතෙව් 2: 1-11)**

SKY LINE TRAVELS (PVT) LTD

ඉන් පසු නත්තල් මධ්‍යම රාත්‍රී දිව්‍ය පූජා යාගය පවත්වන ලද ශාන්ත කැතරින් දේවස්ථානය දැකබලා එම ස්ථානයේ ඔබට පුද්ගලික යාච්ඤාව සඳහා කාලය ඔබට ඇත. මෙහිදී සිංහල බසින් සංවිධානය කරන ලද දිව්‍ය පූජා යාගයට සහභාගී වීම. ඉන් පසු එඬේර තැනිතලාව වෙත ගමන් කිරීම. “බෙෂුවර්” නම් ප්‍රදේශයේ මෙම තැනිතලාව පිහිටා ඇති අතර ඒ අවදියේදී එඬේරුන් විශාල වශයෙන් බැටළුවන් හා අනෙකුත් සතුන් රැකබලා ගනිමින් රැකියාව කළ ස්ථානයකි. එසේම ජේසු බිළිඳුන්ගේ උපත එඬේරුන්ට දන්වන ලද්දේ මේ ස්ථානයේදීය. (ලූක් **2 : 8-18)**

හෙරෝද් රජුගේ නියමයෙන් අලුත උපන් බිලිඳු ඝාතනයෙන් ආරක්ෂා වීම සඳහා ශු.පවුල ඊජිප්තුවට පලා යයි. එම යන ගමනේදී මරිය තුමිය ගුහාවක නතර වී ජේසු බිලිඳුන්ට කිරි දුන් බව සඳහන් වේ. එම අවස්ථාවේ දී කිරි බිංදුවක් බිමට වැටීමෙන් මෙම සම්පූර්ණ ගල් ගුහාවම සුදු පැහැයට හැරී ඇත. මෙම ගුහාවට පිවිසීමට හා එහි ආශ්චර්යමත් බව සියැසින් දැක ගැනීමට ඔබට අවස්ථාව ලැබෙනු ඇත.ඉන් පසු අප නවාතැන් ගන්නා හෝටලයට පැමිණ රාත්‍රී ආහාරය ගෙන එදින නවාතැන් ගැනීම.

## හයවන දිනය - *(උදේ / දිවා / රාත්‍රී)*

සුපුරුදු පරිදි හෝටලයෙන් උදෑසන ආහාරය ගැනීම. ඉන්පසු අපගේ ගැලවුම් කරුවාණන් වන ජේසුස් වහන්සේ ස්වර්ගාරෝහණය වූ ස්ථානය වෙත ගමන් කිරීම. මෙම ස්ථානයේ උන්වහන්සේගේ පා සටහන් ඇති බැවින් එය වන්දනා කිරීමට ද ඔබට අවස්ථාව ලැබෙනු ඇත. (ලූක් **24 : 50-53).** ඉන් අනතුරුව දෙවි පියා ඇමතීමේ යාච්ඤාව අපහට ලබා දුන් ස්ථානය වෙත ගමන් කිරීම. එනම් ජේසුස් වහන්සේ තම ශ්‍රාවකයින් අමතා පරමණ්ඩල යාච්ඤාව ලබා දුන් ස්ථානය. ලෝකයේ භාවිතා වන භාෂා වැඩිම ප්‍රමාණයකින් පරමණ්ඩල යාච්ඤාව මෙම ස්ථානයේ සටහන් කර ඇත. (මතෙව් **6 : 5-15).** ඉන් අනතුරුව ඔලිව් කඳු මුදුනට ගමන් කර ඔලිව් කඳු මුදුනේ සිට පැරණි නගරය හාත්පස පෙනෙන දර්ශනය නැරඹීම.

ඉන් පසු ජේසුස් වහන්සේ රාජාශ්‍රියෙන් ජෙරුසලමට ඇතුළු වූ මාර්ගයට ගමන් කිරීම (ශොක් ඉරුදින අප සිහි කරන අවස්ථාව) ජේසුස් වහන්සේ ජෙරුසලමට පැමිණ ඇතුළු වීමට ප්‍රථම ජෙරුසලම දෙස බලා බොහෝ සේ දුක් වූ බව ශු.බයිබලයේ සඳහන් වේ. එසේ උන්වහන්සේ ජෙරුසලම දෙස බලා ඉදිරි කාලයේදී ජෙරුසලම නගරයට වන්නට යන විපත ගැන කලින්ම දැන, හඬා වැළපුන සේක. (මතෙව් **24 : 1-14).** මෙම ස්ථානය වර්තමානයේ “ඩොමිනස් ෆ්ලෙවිට්” නමින් හැඳින්වෙන අතර එම ස්ථානයද ඔබට දැක ගැනීමට හැකිවනු ඇත. ඉන් අනතරුව සියලු ජාතීන්ගේ දෙව් මැදුර වෙත ගමන් කිරීම. ඉන් පසු ජේසු ක්‍රිස්තුන් වහන්සේ තම ගෝලයන් සමග මහා බ්‍රහස්පතින්දා දින රාත්‍රියේ යාච්ඤා කිරීම පිණිස පැමිණි ස්ථානය එනම් ගෙත්සෙමිනි උයන වෙත පැමිණීම. මෙහිදී උන්වහන්සේ යාච්ඤා කරමින් සිටියදී උන්වහන්සේගේ ලේ බිඳු දහඩිය මෙන් ගලාගිය බව ශු.බයිබලයේ සඳහන් වේ. (ලූක් **22 : 47-53).** මෙහිදී සංවිධානය කරන ලද සිංහල දිව්‍ය පූජා යාගයට සහභාගී වීමට ඔබට අවස්ථාව ලැබෙනු ඇත. ඉන් අනතරුව දිවා ආහාරය.

මරි මවුන් ආත්ම ශරීර පිටින් ස්වර්ගයට ඔසවා ගත් ස්ථානය සියොන් කඳු මුදුනේ පිහිටා ඇත. මෙම ස්ථානයේ ඉදිකර ඇති මරිමවුන් නිදා සිටින ආකාරයේ ප්‍රතිමාවක් ඔබට දැක ගත හැක. මෙම ස්ථානය වර්තමානයේ “ඩොමිෂන්” නමින් හැඳින්වෙන අතර එම ස්ථානයද ඔබට දැක ගැනීමට හැකිවනු ඇත. එපමණක් නොව අන්තිම රාත්‍රී භෝජනය පැවැත් වූ ස්ථානය ද ඩොමිෂන් දෙව් මැදුර හා දාවිත් රජ තුමාගේ සොහොන නැරඹීමට ඔබට අවස්ථාව ලැබෙනු ඇත. ශු. පේදුරු තුමා ජේසුස් වහන්සේව නාඳුනන බව කියා තුන් වරක් ප්‍රතික්ෂේප කරන ලද ස්ථානය “පේදුරු තුමාගේ අපලාපයේ” දෙව් මැදුර ලෙස හැඳින්වේ. මෙම ස්ථානයේත් දේවස්ථානයක් ඉදිකර ඇත. (ලූක් **22 : 54-62).** තවද ජේසුස් වහන්සේව ගෙත්සෙමිනි මල් උයනේදී අල්ලා ගැනීමෙන් පසු රැගෙන ගොස් රඳවා තබා සිටි වදකාගාරය ද වර්තමානයේ මෙම ස්ථානයේ දක්නට ඇත. තවද නායක පූජක කයිපාස්ගේ නිවසද දැක ගැනීමට ඔබට අවස්ථාව ඇත. ඉන් පසු රාත්‍රී ආහාරය ගෙන හෝටලයේ නවාතැන් ගැනීම.

## හත්වන දිනය - *(උදේ / දිවා / රාත්‍රී)*

හෝටලයේදී උදෑසන ආහාරය ගැනීම. ඉන් අනතුරුව දේව මාලිගාව තිබූ තැනට ආසන්නව දැනට ඉතිරිව පවතින අති විශාල පවුරට ගමන් කිරීම. වර්තමානයේ යුදා ජාතිකයින්ට ගමන් කිරීමට හැකි වන්නේ මෙතනට පමණකි. ඔබටත් මෙම ස්ථානයට

SKY LINE TRAVELS (PVT) LTD

**ගොස් යාච්ඤා කිරීමේ අවස්ථාව ලැබෙනු ඇත. ඉන් අනතුරුව අප ඔබව රැගෙන යනු ලබන්නේ ප්‍රථම හා දෙවන දේව මාලිගාවන් ඉදිකර තිබූ ස්ථානය වෙතටය. මෙම ස්ථානය හඳුන්වනු ලබන්නේ "මොරියා" කන්ද ලෙසිනි. ආබ්‍රහම් තුමා තම එකම පුතුණුවන් වන ඊසාක්ව දෙවියන් වහන්සේට බිලිදීම සඳහා පැමිණෙන ස්ථානයද මෙය වේ. (උත්පත්ති 22 : 1-18). ශුද්ධ වූ ස්තේපන් තුමා ප්‍රාණ පරිත්‍යාග වූ ස්ථානය නැරඹීම. (ක්‍රියා 7 : 54-60) මරිය තුමියගේ මෑණියන් වන සාන්ත ආනා මෑණියන්ගේ නිවස පිහිටි ස්ථානය හා දේව මාතාවන් උපන් ස්ථානය වෙතද අප ඔබ රැගෙන යන්නෙමු. බෙත්සෙදා පොකුණ අසල වසර 38ක් සිටි අංශභාගී රෝගියෙකු සුව වූ ස්ථානය නැරඹීම. (ජොහාන් 5 : 1-9). ඉන් අනතුරුව ජේසුස් වහන්සේ කුරුසිය රැගෙන ගමන් ගත් මාර්ගය සහ කල්වාරිය කඳු මුදුන වෙත ගමන් කිරීම. මෙහිදී අප පාදනමස්කාරයට සහභාගී වීම. මෙහිදී තුන් වන ස්ථානයේ ජේසුස් වහන්සේ පාද තැබූ ගල් කැට කිහිපයක් වර්තමානයේත් ඔබට ස්පර්ශ කිරීමට භාග්‍ය උදාවනු ඇත. තවද පස්වන ස්ථානයේදී සීමොන් සිරනේවුස් කුරුසිය ගෙනයාමට උදව්වන විට දී ජේසුස් වහන්සේ ස්පර්ශ කළ ගල් කැටයක් අද වන විටත් එම ස්ථානයේ ඇත. එයද දැක ගැනීමට ඔබට හැකිවනු ඇත. ඔබව පාදනමස්කාරය තුල එයට අදාල සෑම ස්ථානයක්ම වෙත ගෙනයනු ඇත. මෙහිදී සිංහල බසින් සංවිධානය කරනු ලබන දිව්‍ය පූජාවට සහභාගී වීම. ඉන් අනතුරුව දිවා ආහාරය. ඉන් පසු ඉතිරි කාලය ඔබගේ කටයුතු සඳහා / ඔබගේ පුද්ගලික යාච්ඤා සඳහා වෙන් වී ඇත. එහිදී ඔබට අවශ්‍ය කොන්ත බොරලික්කම් යනාදිය මිලදී ගැනීමට ඔබට කාලය කළමනාකරණය කරගත හැකිය. ඉන්පසු රාත්‍රී ආහාරය ගෙන හෝටලයේ නවාතැන් ගැනීම.**

## අටවන දිනය - *(උදේ / දිවා / රාත්‍රී)*

**මෙදින උදෑසන අප නවාතැන් ගන්නා හෝටලයෙන් පිටත්ව  කොළඹ බලා පිටත් වීම සඳහා ටෙලවිව් ගුවන්තොටුපොළ වෙත පැමිණ හුවමාරු ගුවන්තොටුපොළ වෙත පියාසර කිරීම. ඉන් අනතුරුව කොළඹ වෙත ගමන් ගන්නා ගුවන් යානයෙන් කොළඹ කටුනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල බලා පිටත් වීම.**

**ජේසූ පිහිටයි !**

SKY LINE TRAVELS (PVT) LTD

## මීසම් සංඝය වෙනුවෙන් සංවිධානය කරන ලද ශුද්ධවූ දේශය වන්දනා චාරිකාව සඳහා වන මිල ගණන් සහ අනෙකුත් තොරතුරු

*වන්දනා චාරිකාවේ මිල ගණන*

- දෙදෙනෙකු / තිදෙනෙකු සඳහා වන කාමර මිල **- LKR 685,000/=**
- තනි පුද්ගල කාමරයක් සඳහා මිල **- LKR 965,000/=**

❖ **චාරිකාව සඳහා අත්තිකාරම් මුදල ලෙස රු. 300,000/= මුදලක් ගෙවා ලියාපදිංචි වන්න.**

*චාරිකාවට ඇතුළත් දෑ*

- යාමට සහ ඒමට ගුවන් ටිකට්පත්
- ඊශ්‍රායලය සහ ජෝර්දාන් යන රටවල් ද්විත්වය සඳහා වීසා (මේ සඳහා ඔබ විසින් කිසිඳු කර්තව්‍යයක් සිදුකිරීම අවශ්‍ය නොවන අතර, අප විසින් වීසා සඳහා අදාල සියලු කටයුතු සම්පාදනය කරදෙනු ලැබේ)
- ශ්‍රී ලාංකීය නොවන වෙනත් විදේශ ගමන් බලපත්‍ර සඳහා වන ජෝර්දාන් වීසා ගාස්තු
- ඊශ්‍රායල දේශ සීමා තරණය සඳහා වන ගාස්තු
- වායුසමීකරණය කරන ලද හෝටල් පහසුකම්
- වායුසමීකරණය කරන ලද ප්‍රවාහන පහසුකම්
- දිනපතා සිංහල භාෂාවෙන් දිව්‍ය පූජාව
- ආහාර පහසුකම් (උදෑසන / දිවා / රාත්‍රී)
- සිංහල සහ ඉංග්‍රීසි භාෂාවන් සඳහා මග පෙන්වන්නන්ගේ සහය
- අවුරුදු 65 දක්වා වයස් සීමාවන් සඳහා චාරිකා රක්ෂණාවරණය (අවු. 65 ට වඩා වැඩි වන්දනාකරුවන් සඳහා අමතර රු.12,000/= මුදලක් අයවේ.)

*චාරිකාව සඳහා ඇතුළත් නොවන දෑ*

- ගමන් මලු සඳහා වන අමතර බරට අය කරන මුදල්
- ප්‍රධාන ආහාර වේල් අතරතුර ලබා ගන්නා, අමතර කෑම සහ බීම වර්ග සඳහා වියදම්
- ගුවන් තොටුපොළ වෙත පැමිණීමට සහ නැවත යාමට සඳහා වන ප්‍රවාහන පහසුකම්